# මධ්‍යම පරිසර අධිකාරිය

පරිසර අමාත්‍යාංශය

# තනතුරු පුරප්පාඩු

**මධ්‍යම පරිසර අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. කාර්යාල සහායක (පුරප්පාඩු සංඛ්‍යාව - 10) – PL - 1

**බඳවා ගැනීමේ සුදුසුකම්**

- ✓ දෙවාරයකට නොඅඩු වාර ගණනකදී අවම වශයෙන් විෂයයන් පහක් (05) සමඟ අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් විය යුතුය.

**වැටුප් පරිමාණය**

- ✓ 40,500 – 10x450 – 10x490 – 7x540 -15x590 – 62,530

වැටුප් ගෙවනු ලබන්නේ කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උප ලේඛණ ll ට අනුව වන අතර ඔබව රු. 36,475/- ක වැටුප් තලයේ පිහිටවනු ලැබේ. මීට අමතරව රු.17,800/ක ජීවන වියදම් දීමනාවක් ගෙවනු ලැබේ.

2026.01.01 දින සිට වැටුප් තලය රු. 38, 488/-
2027.01.01 දින සිට වැටුප් තලය රු. 40, 500/-

**තනතුරු පුරප්පාඩු පවතින ස්ථාන**

- ✓ ප්‍රධාන කාර්යාලය-බත්තරමුල්ල (තනතුරු 08)
- ✓ කළුතර දිස්ත්‍රික් කාර්යාලය (තනතුරු 01)
- ✓ වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය (තනතුරු 01)

මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.

සියළුම අයදුම්කරුවන්

- වයස අවුරුදු 18ට නොඅඩු වියයුතු අතර අවුරුදු 45 කට නොවැඩි විය යුතුය.
- තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍යා විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

<u>බඳවා ගැනීමේ ක්‍රමවේදය</u>

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබගත් අය තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ලැබේ. අදාළ පරීක්ෂණය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ ක්‍රමවේදයට අනුව සිදු කරනු ලැබේ.

<u>අයදුම්පත්‍ර යොමුකිරීම</u>

ඔබගේ අයදුම්පත උප්පැන්න සහතිකය, අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික සහ සේවා සහතික වල පිටපත් සමඟ ඥාති නොවන නිර්දේශිතයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් දුරකථන අංක සහිතව ලියාපදිංචි තැපෑලෙන් **2025.12.03** දිනට ප්‍රථම පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද අයදුම්පත් පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය වගකියනු නොලැබේ.

අයදුම්පත්‍ර භාරගන්නා දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය
**104,** ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල
**2025.11.12**